පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 08

# අවසාන වාර පරීක්ෂණය - 2019

## කතෝලික ධර්මය

පාසලේ නම : ..........................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම/ඇතුළත්වීමේ අංකය : ...............................................

.......................................................................................... කාලය : පැය 02 යි.

## I කොටස

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. පළමු හා දෙවන ධර්මදූත චාරිකා සඳහා ශුද්ධ වූ පාවුලු තුමා සමඟ සහභාගි වූයේ,
    (1) ශුද්ධ වූ ජොහාන් තුමා ය. (2) ශුද්ධ වූ මතෙව් තුමා ය.
    (3) ශුද්ධ වූ ලූක් තුමා ය. (4) ශුද්ධ වූ පේදුරු තුමා ය.

02. ශුද්ධ වූ ලූක් තුමා පමණක් සඳහන් කරන උපමා කතාව වන්නේ,
    (1) යහපත් සමරිතානුවරයා පිළිබඳ උපමාව (2) නැතිවූ කාසිය පිළිබඳ උපමාව
    (3) වැන්දඹුව හා විනිශ්චයකාරයා පිළිබඳ උපමාව (4) නිධානය පිළිබඳ උපමාව

03. ''දිළිඳු වූ ඔබ භාග්‍යවන්තයෝ ය. මන්ද ...................................... '' හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න.
    (1) දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ යැයි කියනු ලබන්නෝ ය. (2) දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔබගේ ය.
    (3) ඔබ තෘප්තිමත් වන්නේ ය. (4) ඔබ දේශය හිමිකර ගන්නෝ ය.

04. ''එම්මානුවෙල්'' යන්නෙහි අර්ථය වන්නේ,
    (1) එවනු ලැබූ තැනැත්තා ය. (2) දෙවියන් වහන්සේ අප සමඟ ය.
    (3) ආලේප කළ තැනැත්තා ය. (4) දේව ප්‍රේමය අප සමඟ ය.

05. ''අඳන දෙකක් ඇති අය නැති අයට දේවා'' මෙම උපදේශය ජනතාවට ලබා දුන්නේ,
    (1) ජේසුස් වහන්සේ ය. (2) ස්නාවක ජොහාන් තුමා ය.
    (3) ශුද්ධ වූ පාවුලු තුමා ය. (4) ශුද්ධ වූ පේදුරු තුමා ය.

06. ආබ්‍රහම් තුමා කානාන් දේශයට නික්ම යන විට ඔහුගේ වයස,
    (1) අවුරුදු 70 කි. (2) අවුරුදු 75 කි.
    (3) අවුරුදු 95 කි. (4) අවුරුදු 100 කි.

07. සෙකරියස් තුමා පිළිබඳ වැරදි ප්‍රකාශයක් වන්නේ,
    (1) සෙකරියස් තුමාගේ බිරිඳ එළිසෙබෙත් තුමිය යි.
    (2) සෙකරියස් තුමා ස්නාවක ජොහාන් තුමාගේ පියා ය.
    (3) දේව පණිවිඩය අවිශ්වාස කළ නිසා ගොළු බවට පත්විය.
    (4) සෙකරියස් තුමා ලෙවී පූජක පෙළපතට අයත් ය.

08. දේව රාජ්‍යය පිළිබඳ උපමාවක් වන්නේ,
    (1) වපුරන්නාගේ උපමාව (2) කරුණාවන්ත පියාණෝ පිළිබඳ උපමාව
    (3) නැති වූ බැටළුවා පිළිබඳ උපමාව (4) කන්‍යාවන් දසදෙනා පිළිබඳ උපමාව

Education NCP - www.edncp.lk

09. ක්‍රිස්තුන් වහන්සේ දුෂ්ධාත්මාවේශ මිනිසෙකු සුව කළේ,
(1) සේනාකුළු ශාලාවේ දී ය. (2) ගෙරසීනයේ දී ය.
(3) ගලීලයේ දී ය. (4) බෙතෙස්දාවේ දී ය.

10. සමිඳාණන් වහන්සේගේ භෝජනය නුසුදුසු ලෙස වැළඳීමෙන් වළකින ලෙස ශුද්ධ වූ පාවුලු තුමා උපදෙස් දුන්නේ,
(1) කොරෙන්ති සංඝයට ය. (2) එපීස සංඝයට ය.
(3) ගලාති සංඝයට ය. (4) කොලොස්සි සංඝයට ය.

11. සමාරියයන් වෙත ශුද්ධාත්ම දානය කිරීම සඳහා පිටත්ව ගිය අපෝස්තුළුවරුන් දෙදෙනා වන්නේ,
(1) පේදුරු හා ඇන්ඩෘ ය. (2) පාවුලු හා පේදුරු ය.
(3) පේදුරු හා ජොහාන් ය. (4) පාවුලු හා බර්ණබස් ය.

12. ශුද්ධාත්ම ඵලයකි.
(1) දේව භය (2) තේරුම් ගැනීම
(3) ධෛර්යය (4) ස්නේහය

13. ශුද්ධාත්මයාණන් වහන්සේගේ කාර්ය භාරය වන්නේ,
(1) ලෝකය මැවීම (2) ලෝකය ශුද්ධවත් කිරීම
(3) ලෝකය ගලවා ගැනීම (4) ලෝකය පාලනය කිරීම

14. මිහිපිට ශුද්ධ වූ ත්‍රිත්වයේ සංකේතය වන්නේ,
(1) දිව්‍ය යාගය යි. (2) දේවස්ථානය යි.
(3) කිතුනු සභා එකමුතුව යි. (4) කිතුනු පවුල යි.

15. කතෝලික විශ්වාසයට පටහැනි ක්‍රියාවක් **නොවන්නේ,**
(1) නුවාන පැවැත්වීම (2) හූනියම් කිරීම
(3) ලග්න පලාපල බැලීම (4) ජේන ඇසීම

16. අති උතුම් xii පියුස් ශුද්ධෝත්තම පියතුමා විසින් නිකුත් කළ විශ්ව ලේඛනයකි.
(1) වෙහෙසෙන මිනිස්සු (2) දෙවියන් වහන්සේගේ මධ්‍යස්ථකයාණෝ
(3) බලාපොරොත්තුවේ එළිපත්ත (4) ලෝක සාමය

17. "ජනතාව වෙනුවෙන් ඔවුන් උදෙසා කරන සේවය යන්න මුල් කාලයේ හැඳින් වූ වචනය වන්නේ,
(1) ලාඕස් (2) ලිටර්ජි
(3) ලිටුර්ජියා (4) එර්ගෝන්

18. අපෝස්තුළුවරුන් වෙත ශුද්ධාත්මයාණන් වැඩම කළ දිනය හඳුන්වන්නේ,
(1) ස්වර්ගාරෝහණ දිනය ලෙස ය. (2) පාස්කු දිනය ලෙස ය.
(3) කැප කිරීමේ දිනය ලෙස ය. (4) පෙන්තකොස්ත දිනය ලෙස ය.

19. දේව වාක්‍ය පිළිවෙතට අයත් කොටසක් වන්නේ,
(1) බොදුනෙන් පසු යැදුම (2) පියතුමාගේ දේශනය
(3) සාමය පැතීම (4) පඬුරු පෙරහැර

20. ශුද්ධ වූ සභාවේ නිළ යැදුම වන්නේ,
(1) විශ්වාස ලක්ෂණය යි. (2) ස්වාමිවාක් ආරාධනය යි.
(3) ත්‍රිත්ව ස්තෝත්‍රය යි. (4) යාම යැදුම යි.

(ලකුණු 2X20=40)



Education NCP - www.edncp.lk

## II කොටස

- **පළමු ප්‍රශ්නය** හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. (i) ලූක් ශුභාරංචියේ හමුවන ප්‍රශංසා ගීත **හතරක්** නම් කරන්න.
    (ii) යෙසායා ග්‍රන්ථයට අනුව ක්‍රිස්තුන් වහන්සේට පැවරී තිබූ දූත කාර්යයන් **හතරක්** ලියන්න.
    (iii) ජේසුස් වහන්සේ සිදු කළ ප්‍රාතිහාර්ය වර්ග **හතර** නම් කරන්න.
    (iv) ඔබ දන්නා ශුද්ධවන්තයින් **හතරදෙනෙක්** නම් කරන්න.
    (v) දිව්‍ය පූජාවේ පිළිවෙත් **හතරක්** නම් කරන්න.

(ලකුණු 4X5=20)

02. (i) ''තියෝපිලස්'' යන්නෙහි අර්ථය ලියන්න. (ලකුණු 02)
    (ii) ශුද්ධ වූ ලූක් ශුභාරංචිය හඳුන්වන වෙනත් නම් **තුනක්** ලියන්න. (ලකුණු 03)
    (iii) ශුද්ධ වූ ලූක් තුමාගේ ජීවිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ **පහක්** ලියන්න. (ලකුණු 05)

03. (i) දිව්‍ය සත්ප්‍රසාදය ලැබීම සඳහා සූදානම් වන ආකාර **දෙක** ලියන්න. (ලකුණු 02)
    (ii) දිව්‍ය සත්ප්‍රසාදයේ ලක්ෂණ **තුනක්** ලියන්න. (ලකුණු 03)
    (iii) ඉරුදින ශුද්ධවන්තව ගත කිරීමට ඔබට කළ හැකි කාර්යයන් **පහක්** ලියන්න. (ලකුණු 05)

04. (i) ශුද්ධාත්ම දීමනා **දෙකක්** ලියන්න. (ලකුණු 02)
    (ii) අභිවෘද්ධි ආලේපය ලැබීමට අවශ්‍ය සුදුසුකම් **තුනක්** ලියන්න. (ලකුණු 03)
    (iii) ජේසුස් වහන්සේව අන් අයට හඳුන්වා දීමට ඔබ කරන ක්‍රියාකාරකම් **පහක්** ලියන්න. (ලකුණු 05)

05. (i) දස පනතේ තුන්වන පනත ලියන්න. (ලකුණු 02)
    (ii) කිතුනුවන් වන අපට ඉරුදින වැදගත් වීමට හේතු **තුනක්** ලියන්න. (ලකුණු 03)
    (iii) අර්ථාන්විතව දිව්‍ය පූජාවට සහභාගි වීමට කළ හැකි කාර්යයන් **පහක්** ලියන්න. (ලකුණු 05)

06. (i) ජනවන්දනාව යනු කුමක්ද? (ලකුණු 02)
    (ii) ජනවන්දනාවේ ප්‍රධාන අංග **තුන** නම් කරන්න. (ලකුණු 03)
    (iii) අප රට උදෙසා කිව හැකි යාච්ඤාවක් නිර්මාණය කරන්න. (ලකුණු 06)

***

Education NCP - www.edncp.lk

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 08

අවසාන වාර පරීක්ෂණය - 2019
කතෝලික ධර්මය

**පිළිතුරු පත්‍රය**

## I කොටස

01. (3) ශුද්ධ වූ ලූක් තුමා ය.
02. (1) යහපත් සමරිතානුවරයා පිළිබඳ උපමාව
03. (2) දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔබගේ ය.
04. (2) දෙවියන් වහන්සේ අප සමඟ ය.
05. (2) ස්නාවක ජොහාන් තුමා ය.
06. (2) අවුරුදු 75 කි.
07. (4) සෙකරියස් තුමා ලෙවී පූජක පෙළපතට අයත් ය.
08. (1) වපුරන්නාගේ උපමාව
09. (2) ගෙරසීනයේ දී ය.
10. (1) කොරොන්ති සංඝයට ය.
11. (3) පේදුරු හා ජොහාන් ය.
12. (4) ස්නේහය
13. (2) ලෝකය ශුද්ධවත් කිරීම
14. (4) කිතුනු පවුල යි.
15. (1) නුවාන පැවැත්වීම
16. (2) දෙවියන් වහන්සේගේ මද්‍යස්ථකයාණෝ
17. (3) ලිටුර්ජියා
18. (4) පෙන්තකොස්ත දිනය ලෙස ය.
19. (2) පියතුමාගේ දේශනය
20. (4) යාම යැදුම යි.

(ලකුණු 2X20=40)

## II කොටස

01. (i) මරිය උදාන ගීය/ සෙකරියස්තුමාගේ ප්‍රශංසා ගීය/ දේව දූතයන්ගේ ප්‍රශංසා ගීය/ සිමියොන්ගේ ප්‍රශංසා ගීය

(ii) දිළිඳුන්ට සුබාරංචිය ප්‍රකාශ කිරීම/ වහලුන්ට මිදීම දීම/ අන්ධයන්ට පෙනීම දීම/ අන්ධයින්ට පෙනීම දීම/ පීඩිත වූවන් මිදීම

(iii) ස්වභාව ධර්මය හා සම්බන්ධ ප්‍රාතිහාර්යය/ රෝගීන් සුව කිරීම/ දුෂ්ආත්මයන් දුරු කිරීම/ මළවුන් උත්ථාන කිරීම

(iv) ලියා ඇති ශුද්ධවන්තයින්ගේ නම් අනුව ලකුණු ලබා දෙන්න.

(v) ආරම්භක පිළිවෙත/ දේව වාක්‍ය පිළිවෙත/ පුදසුන සූදානම් කිරීමේ පිළිවෙත/ ස්තෝත්‍ර යාගික පිළිවෙත/ ධර්මදූත කාර්යය සඳහා පිටත් කර යැවීමේ පිළිවෙත

(ලකුණු 4X5=20)

02. (i) දෙවියන් වහන්සේගේ මිත්‍රයා (ලකුණු 02)

(ii) යාච්ඤාවේ සුබාරංචිය/ අන්‍ය ජාතීන්ගේ සුබාරංචිය/ දයාවේ සුබාරංචිය/ ශුද්ධාත්මයාණන්ගේ සුබාරංචිය/ කාන්තාවන්ගේ සුබාරංචිය/ දිළින්දන්ගේ සුබාරංචිය/ කොන්වූවන්ගේ සුබාරංචිය (ලකුණු 03)

(iii) ලියා ඇති ආකාරය අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

03. (i) ආත්මික සූදානම/ශාරීරික සූදානම (ලකුණු 02)

(ii) ප්‍රසාද නිධානයකි/ භෝජනයකි/ යාගයකි/ ගිවිසුමකි/ ස්තුති කිරීමකි/ සිහිකිරීමකි (ලකුණු 03)

(iii) දිව්‍ය පූජාවට සහභාගි වීම/ දහම් පාසලට සහභාගි වීම/ දේව වචනය කියවීම/ වෙනදාට වඩා යාච්ඤා කිරීම/ රෝගීන්ට උපස්ථාන කිරීම/ ශ්‍රමදානවලට සහභාගි වීම ආදී ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

04. (i) ප්‍රඥාව/ තේරුම් ගැනීම/ දැනුමැතිකම/ ධෛර්යය/ දැන ගැන්ම/ දේව භක්තිය/ දේව භය (ලකුණු 02)

(ii) ප්‍රසාද ස්නාපනය ලබා තිබීම/ වයස අවුරුදු 14 සම්පූර්ණ වීම/ ඉෂ්ට වරප්‍රසාද ඇතිව සිටීම/ නිසි ධර්මෝපදේශයක් ලබා තිබීම/ උනන්දුව හා ආශාව (ලකුණු 03)

(iii) යහපත් කිතුනු දරුවෙක් ලෙස ජීවත් වීම/ දිව්‍ය පූජාවට සහභාගි වීම/ අන් අයට ප්‍රේමය දැක්වීම/ සමාව දීම හා සමාව ගැනීම/ දේව වචනය බෙදා ගැනීම/ ආගමික පොත පත බෙදා ගැනීම ආදී ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

05. (i) ඉරුදිනත් ණය මංගල්‍ය දිනත් නිවාඩු වලංගු කරව (ඉරුදින ශුද්ධ ලෙස ගත කරව) (ලකුණු 02)

(ii) ජේසුස් වහන්සේ උත්ථාන වූ දිනය/ උත්ථාන වූ ජේසුස් වහන්සේ වැඩිපුරම දර්ශනය වූ දිනය/ ශුද්ධාත්මාගමනය සිදු වූ දිනය (ලකුණු 03)

(iii) ආරම්භයේ සිට අවසානය දක්වා දිව්‍ය පූජාවට සහභාගි වීම/ පිළිතුරු දීමෙන්, ගායනයෙන් දිව්‍ය පූජාවට එකතුවීම/ දේව වචනයට සවන් දීම/ භක්තියෙන් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීම/ ආදී ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

06. (i) අතීන්ද්‍රීය ක්‍රිස්තු දේහයේ හිස වන ජේසුස් වහන්සේත් එහි අවයව වන ශුද්ධවූ සභාවත් දෙවියන් කහන්සේට කරන පූර්ණ ප්‍රසිද්ධ වන්දනාව (ලකුණු 02)

(ii) දිව්‍ය පූජාව/ ප්‍රසාද නිධාන/ යාම යැදුම (ලකුණු 03)

(iii) ලියා ඇති ආකාරය අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

***